**සමූහයේ සාමාජිකයන්ට දැන්වීමයි**

S CI 2014 04423

**පාර්ශ්ව:**

A.S. ඇයගේ නෛතික භාරකාර MARIE THERESA ARTHUR පැමිණිලිකරු

- සහ -

සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂක ඇමති පළමු විත්තිකරු

ඔස්ට්‍රේලියානු **මධ්‍යම** ආණ්ඩුව දෙවැනි විත්තිකරු

---

පහත දැක්වෙන නිර්වචනයට සුදුසුකම් ඇති සෑම පුද්ගලයෙක් සඳහාම වන්දි ඉල්ලා 2014 අගෝස්තු 26 වන දින වික්ටෝරියානු ශ්‍රේෂ්ඨාධිකරණයේ (Supreme Court of Victoria ) සාමූහික නඩු කටයුතු (සාමූහික නඩුව) ආරම්භ කරන ලදී:

- 2011 අගෝස්තු 27 සිට 2014 අගෝස්තු 26 (සෑම දිනයක්ම ඇතුළුව) අතරතුර ක්‍රිස්මස් දූපතේ රඳවා සිටි (ඉන් පසු ඔවුන්ව රැඳවුමෙන් නිදහස් කර තිබුණත්, නැතත්) (අදාල කාලසීමාව) පුද්ගලයෙක් වීම; සහ
- අදාල කාලසීමාව තුල රැඳවුමේ සිටියදී පීඩාවට පත්වූ සහ/හෝ ගර්භනී වූ පුද්ගලයෙක් වීම; සහ
  - අදාල කාලසීමාව තුල, ඔහුට, ඇයට හෝ ඔහුගේ හෝ ඇයගේ දෙමාපියන්ට සාධාරණ සෞඛ්‍ය සත්කාර සැපයීමට ඔස්ට්‍රේලියානු රජය විසින් සිදු වුයේ යැයි පැවසෙන අසමත්වීම හේතුවෙන් පීඩාවට පත් හෝ පීඩාව උග්‍රායනය වීමකට පත්වූ පුද්ගලයෙක් වීම; සහ
- 1958 සංක්‍රමණ පනතේ 36 වන වගන්තිය (Migration Act 1958 (Cth))යටතේ ඔස්ට්‍රේලියාව ඔහුට හෝ ඇයට ආරක්ෂාව සැපයීමට බැඳීම් ඇතැයි ඉල්ලා සිටි පුද්ගලයෙක් වීම .

ඉහත නිර්වචනයට අයිතිවූ සෑම පුද්ගලයෙක්ම සාමූහික නඩුවේ සාමාජිකයෙක් විය. ('නායක පැමිණිලිකරු' ලෙස හැඳින්වෙන) එක් පුද්ගලයෙක් විසින් ඇය වෙනුවෙන් සහ සමූහයේ සියළු දෙනාම වෙනුවෙන් නඩුව ඉදිරිපත් කරන ලදී. මෙම නඩුවේ නායක පැමිණිලිකරු 'A.S.' ලෙස ආරූඪනාමයකින් හඳුන්වන බාලවයස්කාරියකි.

සංක්‍රමණ සහ දේශසීමා ආරක්ෂක ඇමති (**ඇමතිවරයා**) සහ ඔස්ට්‍රේලියානු මධ්‍යම ආණ්ඩුව (**මධ්‍යම ආණ්ඩුව**) යන දෙපාර්ශ්වයටම එරෙහිව සාමූහික නඩුව පවරා ඇත.

ක්‍රිස්මස් දූපතේ රැඳවුම් හා සම්බන්ධව අකර්මණ්‍යතා ගණනාවක් තිබුනු බවත් ඒ හේතුවෙන් A.S. සහ සමූහයේ සාමාජිකයන්ට ශාරීරික සහ මානසික පීඩා සිද්දවූ බවටත් චෝදනාකෙරිණි. මේ චෝදනා ඇමතිවරයා සහ මධ්‍යම ආණ්ඩුව විසින් ප්‍රතික්ෂේප කෙරෙන ලදී.

ඔබ මේ සාමූහික නඩුවේ විභව්‍ය සමූහ සාමාජිකයෙක් වීම නිසා මේ වසරේ මුලදී සංක්‍රමණ සහ දේශසීමා දෙපාර්තමේන්තුවෙන් එවන ලද නඩුවෙන් ඉල්ලා අස්වීමේ දැන්වීමක් ඔබට ලැබී තිබෙන්නට ඉඩ ඇත.

**නඩු කටයුතු සාමුහික නඩුවක් ලෙස තව දුරටත් පවත්වා ගන යනු නොලැබේ**

**නඩු කටයුතු සාමුහික නඩුවක් ලෙස තව දුරටත් පවත්වා ගෙන නොයන ලෙස 2017 මාර්තු 27 වන දින උසාවිය විසින් නියෝග කරන ලදී.** මින් අදහස් වන්නේ, දැන් මේ නඩුව අදාල වන්නේ නායක පැමිණිලිකරු 'A.S.' ට පමණක් බව සහ වෙන කිසිම පුද්ගලයෙකු සඳහා වන්දි හෝ හිමිකම් මෙමගින් තීරණය නොවන බවයි.

මීට කලින් සමුහයේ සාමාජික නිර්වචනයට අයත්වූ ඕනෑම කෙනෙක්, ක්‍රිස්මස් දූපතේ රඳවා සිටි අතරතුර තමන් අත්විඳින ලද පීඩා සඳහා වන්දි ඉල්ලීමට බලාපොරොත්තු වන්නේ නම් තමන් විසින් තම උසාවි නඩු කටයුතු දැන් ආරම්භ කළ යුතුය.

**මෙය බලපාන්නේ කාටද?**

ඉහත දැක්වූ සමුහයේ සාමාජික නිර්වචනයට අයත්වන සෑම පුද්ගලයෙකුටම උසාවියේ නියෝගය බලපායි. මෙම නියෝගය ඔබට බලපාන්නේ යයි ඔබ සිතන්නේ නම් හැකි ඉක්මනින් ඔබ ස්වාධීන නීති උපදෙස් ලබා ගත යුතුය.

**පුද්ගලික ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා කාල සීමා**

**වන්දි ඉල්ලීම් ඉදිරිපත් කිරීම ඕස්ට්‍රේලියාවේ කාල සීමාවන් පනවා තිබේ.** පුද්ගලිකව වන්දි ඉල්ලීමට බලාපොරොත්තු වන පුද්ගලයින්, එම හේතුව නිසාත් හැකි ඉක්මනින් ස්වාධීන නීති උපදෙස් ලබා ගැනීම වැදගත්ය.

**අභියාචනා හිමිකම්**

නඩු කටයුතු සාමුහික නඩුවක් ලෙස තව දුරටත් පවත්වා ගෙන නොයන ලෙස පනවන ලද උසාවි නියෝගයට එරෙහිව අභියාචනා කිරීමට සමුහ නඩුවේ සමුහ සාමාජිකයන්ව සිටි පුද්ගලයන්ට අයිතිය තිබේ. එනමුත් එසේ අභියාචනා ආරම්භ කිරීමට ඇති කාලසීමාව 2017 මැයි 24 වන දින ඉකුත් වේ. ඔබ අභියාචනා කිරීමට බලාපොරොත්තු වන්නේ නම් හැකි ඉක්මනින්, මේ දිනයට සෑහෙන තරම් කලකට ප්‍රථම ඔබ නීති උපදෙස් ලබා ගත යුතුය.

**වැඩි තොරතුරු**

ඔබට යම් ප්‍රශ්නයක් ඇත්නම් හෝ වැඩිදුර විස්තර අවශ්‍ය නම් www.mauriceblackburn.com.au/christmasisland වෙත පිවිසෙන්න, 1800 286 052 අමතන්න, නැතහොත් මේ ලිපිනයට ඊමේල් පණිවුඩයක් එවන්න: christmasisland@mauriceblackburn.com.au.

ඉල්ලීම් ප්‍රකාශනය, විත්තිවාචක සහ මෙම ලියවිලි වල සංශෝධිත සංස්කරණ ඇතුලු නඩුවට අදාල ලියකියවිලි christmasisland@mauriceblackburn.com. අමතා හෝ Supreme Court of Victoria මේ නඩුවට ආදල වෙබ් අඩවියෙන් ඔබට බැලීමට පුළුවන:

http://www.supremecourt.vic.gov.au/home/law+and+practice/class+actions/christmas+island+detention+centre+class+action

ඔබට ඔබ කැමති වෙනත් ඕනෑම නීතිඥයෙක් අමතා මෙම දැන්වීමේ සඳහන් කරුණු ගැන නීති උපදෙස් ලබා ගැනීමටද පුළුවන.